මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ ලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\13

2023.01.13

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පළාත් පාලන ඡන්ද විමසීමට අදාළ ඇප තැන්පත් භාර ගැනීම සම්බන්ධව දිස්ත්‍රික් ලේකම්වරුන්/ තේරීම් භාර නිලධාරීන් වෙත 2023.01.10 වන දින නිකුත් කරන ලද ලිපිය පිළිබඳව ඔහු කොමිෂන් සභාව වෙත කැඳවා අද දින විමසීමක් කරන ලදී. එහිදී කරුණු දක්වමින් ලේකම්වරයා විසින්, ඔහු වෙත වගකීම් පවරා තිබූ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව එම තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ ලිපිය නිකුත් කළ බවත්, ඉන් අනතුරුව එය සුදුසු නොවන බවට හැඟී ගිය බැවින්, පැයක් වැනි කාලයක් තුළ එම ලිපිය ආපසු කැඳවීමට ක්‍රියා කළ බවත් ප්‍රකාශ කරන ලදී. තවදුරටත් ප්‍රකාශ කර සිටියේ මැතිවරණ කොමිෂන් සභාවේ ක්‍රියාවලියට මැදිහත්වීමේ කිසිදු අරමුණක් හෝ චේතනාවක් නොතිබූ බවත් හුදෙක් අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක කිරීම පමණක් සිදු කළ බවත් ය.

ලිපිය නිකුත් කර කෙටි කාලයක් තුළ එය ඉවත් කර ගැනීමට කටයුතු කර ගැනීම හේතුවෙන් ඇප තැන්පත් කිරීමේ ක්‍රියාවලියට කිසිදු අගතියක් සිදු නොවූ බවත් ඊට පසු දින පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් 131 ක් ඇප තැන්පත් කිරීමෙන් එය පැහැදිලි වන බවත් ය.

මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යය භාරය හා ඡන්ද විමසීම් අවස්ථාවකදී ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත පවරා දී ඇති බලතල හා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව රාජ්‍ය නිලධාරීන් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳවද ඔහු වෙත පැහැදිලි කර දෙන ලදී. අදාළ ලිපිය නිකුත් කිරීම මත මැතිවරණ කොමිෂන් සභාවට යම් අපහසුතාවක් සිදු වූයේ නම් ඒ පිළිබඳව සමාව අයදමින් ඉදිරියේදී එවැනි තත්තවයක් ඇති නොවීමට කටයුතු කරන බවද ලේකම්වරයා විසින් තවදුරටත් තහවුරු කරන ලදී.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්